සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

## Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number: ME/E/03/18 | ඔබේ අංකය / உமது இல / Your Number: | දිනය / திகதி / Date: 2018.08.15 |

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ**
**අංක - සබර/2018/05**

සබරගමුව පළාතේ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හා කලාප අධ්‍යාපන කාර්යාලවල සියළුම ගණකාධිකාරීවරුන්,
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**රාජ්‍ය අංශයේ ආයතනවලට කාර්යමණ්ඩල බඳවා ගැනීම් හා වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙනි.**

උක්ත කරුණ යටතේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2018.07.18 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ : 03/2018 කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවමි. (අදාල චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත).

02. විශේෂයෙන්ම එම චක්‍රලේඛයේ (II) ඡේදයේ දක්වා ඇති පරිදි රජයේ ආයතනයක අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා විවිධ කාණ්ඩ යටතේ නිලධාරීන්/සේවකයින් රඳවාගෙන වැටුප් හා දීමනා ගෙවීම සපුරා තහනම් වේ. එසේ අතිරික්ත කාර්ය මණ්ඩල සඳහා වැටුප් හා දීමනා ගෙවා ඇත්නම් අදාල ආයතනයේ ප්‍රධානියා සහ මූල්‍ය අංශයේ ප්‍රධානියා ඊට වගකිව යුතු අතර, අදාල වැය බරද එම නිලධාරීන් විසින් දැරිය යුතුය.

03. එබැවින් ඔබ ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලය (කාර්යාලයේ නිලධාරීන්, පාසල්වල ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය ද ඇතුළුව) ඉක්මවා රඳවා නොගත යුතු බව මෙයින් අවධාරණය කරන අතර, අතිරික්ත කාර්ය මණ්ඩලය තුලනය කර නිසි පරිදි පවත්වා ගෙනයාම ඔබගේ වගකීමකි.

04. මේ පිළිබඳව සියළුම විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වන අතර, විශේෂයෙන්ම පාසල්වල අතිරික්ත ගුරුවරුන් රඳවා ගැනීම සහ වැටුප් හා දීමනා ගෙවීම පිළිබඳ වගකීම විදුහල්පතිවරුන්හට පැවරේ. කෙසේ නමුත් මෙහි අවසන් වගකීම ඔබට හා ඔබගේ මූල්‍ය අංශයේ ප්‍රධානියා වෙත පැවරෙන බැවින් මෙම කරුණ පිළිබඳව ඔබගේ දැඩි අවධානය හා අධීක්ෂණය යොමු කල යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි.

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

මහින්ද එස්. වීරසූරිය,
ලේකම්,
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

Ministry of Provincial Education * Sabaragamuwa *

පිටපත් :

1. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්. - දැ.පි.
2. සබරගමුව පළාත් පාසල්වල සියළුම විදුහල්පතිවරුන්. - දැ.පි. හා අ.ක.ස.


ගරු අමාත්‍යතුමා / Hon.Minister — Office-045-5623222,045-2287306, Residence-045-2222538, Mobile-077-9102001, Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් / Secretary — Office-045-2223015, Residence-045-2232985, Mobile-071-4402000, email-msweerasooriya@gmail.com

කාර්යාලය / Office — නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542, Fax-045-2228042